## පළමුවැනි පරිශිෂ්ටය

(අ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1966 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකුවේ සහ බැංකු ආයතන කටයුතු හා ගනුදෙනු වලට අදාළ, කොටස්.

(ආ) 1966 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

**(අ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1966 දී පනවන ලද ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකු වේ සහ ලංකාවේ අනෙකුත් බැංකු ආයතන වල කටයුතු හා ගනුදෙනු වලට අදාළ කොටස්.**

**1966 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත.**

1961 අංක 65 දරන මුදල් පනත සංශෝධනය කැරෙන පනතෙකි.

**(සම්මත කළ දිනය 1966 අප්‍රේල් 6 වැනි දින)**

1. මේ පනත 1966 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හැඳින් විය හැකිය.

2. 1961 අංක 65 දරන මුදල් පනතේ 3 වැනි වගන්තිය, ඒ වගන්තියේ අගට පහත දක්වෙන අළුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

‘ (5) බැංකුවේ සාමාන්‍ය කොටසක් රජය වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලබන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බ්‍රෝකර් කෙනෙකුගේ මාර්ගයෙන් වූ විකිණීමක් මගින් ක්‍රියාත්මක කළ පැවරීමක ප්‍රකාර ඒ කොටසේ අයිතිකරු වී යම් තැනැත්තෙක් සිටියේ නම්,

(අ) ඒ පැවරීම ඒ දිනයේ දී බැංකුවේ පොත් වල ලියා පදිංචි නොකළ බව ; සහ

(ආ) ඒ තැනැත්තා ඒ දිනයේ දී කොටසේ යථා පරිදි ලියාපදිංචි ධාරකයෙකුව නො සිටි බව,

නොසලකා ඒ තැනැත්තා ඒ දිනයේ දී ඒ කොටසේ ධාරකයාව සිටි ලෙස මේ වගන්තියේ කාර්ය යන් සඳහා සියළු කල්හි ම සැලකිය යුතු අතර, ඒ අනුව බැංකුවේ යම් සාමාන්‍ය කොටසක් සම්බන්ධයෙන් ‘‘ (1) වැනි උප වගන්තියේ එන ‘‘ ධාරක ’’ යන යෙදුමට ඒ තැනැත්තාත් ඇතුළත් ලෙස සියළු කල්හි සැලකිය යුතුය. ’

**1966 අංක 21 දරන ආසියානු සංවර්ධන බැංකු ගිවිසුම (ස්ථිර කිරීමේ) පනත.**

**ලංකාව අත්සන්කරුවකු වන්නා වූද, ආසියානු සංවර්ධන බැංකුව පිහිටුවන්නා වූද ගිවිසුම ලංකාව විසින් ස්ථිර කිරීමට හෝ පිළිගැනීමට බලය පැවරීමෙන් ලංකාවට ඒ බැංකුවේ සාමාජිකත්වය ලබා ගත හැකිවීම පිණිස පනවනු ලබන පනතෙකි.**

**(සම්මත කළ දිනය : 1966 සැප්තැම්බර් 24 වැනි දින)**

1. මේ පනත 1966 අංක 21 දරන ආසියානු සංවර්ධන බැංකු ගිවිසුම (ස්ථිර කිරීමේ) පනත යනුවෙන් හැඳින් විය හැකිය.

2. නීත්‍යානුකූල ලේඛනයෙහි නම් කරනු ලැබිය හැකි තැනැත්තා විසින් ලංකා රජය වෙනුවෙන් පහත දක්වෙන කටයුතු කරන ලෙස සවකීය අත්සන සහිත නීත්‍යානුකූල ලේඛන යක් මාර්ගයෙන් ඒ තැනැත්තාට බලය ලබා දීමට අග්‍රාණ්ඩුකාරවරයාට මෙයින් බලය පවරනු ලැබේ.

(අ) මේ පනතෙහි ‘‘ බැංකුව ’’ යනුවෙන් සඳහන් කරනු ලබන ආසියානු සංවර්ධන බැංකුව පිහිටු වන්නා වූද, ලංකාව අත්සන්කරුවකු වන්නා වූ ද, මේ පනතෙහි ‘‘ ගිවිසුම ’’ යනුවෙන් සඳහන් කරනු ලබන ගිවිසුම ස්ථිර කිරීම හෝ පිළි ගැනීම ; හෝ

(ආ) ගිවිසුමේ කොන්දේසිවල 64 වන වගන්තිය සහ ඒ කොන්දේසි වල " අ " වන ඇමුණුම ප්‍රකාර බැංකුවේ මුල් සාමාජිකයකු වීමට හිමිකම් ලත් ලංකාවට බැංකුවේ සාමාජිකත්වය පිළිගත හැකි වීම පිණිස ලංකාවේ නීතිය අනුව රජය විසින් ගිවිසුමේ කොන්දේසි වෙන් කොට තැබීමක් නොමැතිව, පිළිගෙන ඇති බවත්, එකී කොන්දේසි යටතේ රජයේ වගකීම් සියල්ල ම ක්‍රියාවේ යෙදීමට රජයට හැකි වන පරිදි රජය විසින් සියළු පියවර ගෙන ඇති බවත් ප්‍රකාශ කරන ස්ථිර කිරීමේ හෝ පිළිගැනීමේ නීත්‍යානුකූල ලේඛනයක් එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ලේකම්වරයා වෙත තැන්පත් කොට තැබීම.

3. ගිවිසුමේ VIII වන පරිච්ඡේදයෙහි විධිවිධාන වලට ලංකාවෙහි දී නීතියෙහි බලය ලැබිය යුතු අතර, එපරිද්දෙන් එකී VIII වන පරිච්ඡේදයෙහි නිශ්චිත ව සඳහන් තත්ත්වය, විශේෂ මුක්ති, නිදහස් කිරීම් සහ වරප්‍රසාද ලංකාවෙහි දී බැංකුවට ලැබිය යුතුය.

4. ගිවිසුමේ කොන්දේසි යටතේ ලංකා රජය විසින් බැංකුවට ගෙවිය යුතු වූ හෝ කලින් කල ගෙවිය හැකි වූ මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතුය.

5. (1) 4 වන වගන්තිය යටතේ ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීම අවශ්‍ය වන යම් මුදලක් ලබා දීමේ කාර්යය සඳහා පොළිය නො ලැබෙන්නා වූ ද, අන් සතු කළ නොහැකි වූ ද, නෝට්ටු හෝ බැඳීම්, තමා සුදුසු යයි සලකන ආකාරයෙන්, ඇති කොට ලංකා මහ බැංකුවට නිකුත් කිරීමෙන් ලංකා රජය වෙනුවෙන් ණය ලබා ගැනීමට මුදල් ඇමතිවරයාට මෙයින් බලය පවරනු ලැබේ.

(2) මුදල් නීති පනතෙහි කුමක් සඳහන් වුවද, මේ වගන්තියේ (1) වැනි උප වගන්තියෙහි විධිවිධාන අනුව ඇති කොට නිකුත් කරනු ලැබූ යම් නෝට්ටු හෝ බැඳීම් භාර ගැනීමට හා ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට මෙයින් බලය පවරනු ලැබේ.

(3) මේ වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ ඇති කොට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරනු ලැබූ යම් නෝට්ටු හෝ බැඳීම් නිදහස් කර ගැනීම පිණිස අවශ්‍ය මුදල් සියල්ල ම ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතුය.

6. ගිවිසුමේ කොන්දේසි යටතේ ලංකා රජය විසින් හෝ ඒ වෙනුවෙන් බැංකුවෙන් බාර ගනු ලබන මුදල් සියල්ල ම ලංකාවේ ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය ; තව ද, එසේ බාර ගනු ලබන මුදල්, ඒ මගින් මූලධනය නිරූපණය කරනු ලබන ප්‍රමාණයට, යම් ලිඛිත නීතියක් යටතේ ඒ සඳහා අන් ලෙසකින් විධිවිධාන සලස්වා නොමැති නම්, මුදල් ඇමතිවරයා විසින් නියම කළහැකි පරිදි මේ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරනු ලැබූ නෝට්ටු හෝ වෙනත් බැඳීම් නිදහස් කර ගැනීම පිණිස කලින් කල යෙදවිය යුතුය.

7. (1) ගිවිසුමේ කොන්දේසි වල විධිවිධාන අතුරෙන් යමක් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය යයි තමා විසින් යුක්ති සහගතව සැලකිය හැකි වෙනත් විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින්, මුදල් ඇමතිවරයා විසින් සැලැස්විය හැකිය. මේ උප වගන්තිය යටතේ පනවා එලෙස පළ කරනු ලැබූ සෑම ආඥාවක් ම නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුවාත් හැර, දින දහ හතරක් ඇතුළත දී අනුමත නොකොට ඇතොත් මිස නීතියේ බලය ඊට ලැබිය යුතුය.

(2) ගිවිසුමේ කොන්දේසි යටතේ සවකීය ආර්ථික වගකීම් වලට මුහුණ දීමට හෝ ණය තුරුස් වලින් නිදහස් වීමට ලංකා රජයට හැකි වන පරිදි, යුක්ති සහගතව අවශ්‍ය යයි තමා විසින් සැලකිය හැකි සියළු පියවර ගැනීමත්, සෑම වැඩ පිළිවෙළක් ම යෙදීමත්, මුදල් ඇමතිවරයා විසින් කළ හැකිය.

## 1966 අංක 21 දරන ආසියානු සංවර්ධන බැංකු ගිවිසුම

## (ස්ථිර කිරීමේ) පනතේ උපලේඛනය පිළිබඳ සටහන.

ආසියානු සංවර්ධන බැංකුව පිහිටුවීම පිණිස වූ ගිවිසුමේ පෙළ හා එහි ඇමුණුම් මෙම උප ලේඛනයෙන් දක්වෙයි. පහත සඳහන් වනුයේ එම ගිවිසුමේ ලුහුඬු සාරාංශයකි.

ආසියානු සංවර්ධන බැංකුව පිහිටුවීමට මුල් වූ හේතූන් ගිවිසුමට සපයා ඇති පූර්විකාවේ දක්වා ඇත. එයින් ප්‍රධාන හේතුව වනුයේ ආසියානු සහ ඈත පෙරදිග ප්‍රදේශයන්ට අතිරේක සංවර්ධන මුදල් ලබා ගැනීමට සැලසීමය. එසේ සැලසීමට බලාපොරොත්තු වනුයේ එම ප්‍රදේශය තුළින් සහ පිටතින් එවැනි අරමුදල් සහ අනෙකුත් සම්පත් අවශ්‍ය මාර්ගවල යෙදවීමෙන් සහ දේශීය ඉතුරු කිරීම් ඉහළ යාමකට හා සංවර්ධන අරමුදල් මෙම ප්‍රදේශයට වැඩියෙන් ගලා ඒමට උපකාරි වන තත්ත්වයන් ඇතිකර වර්ධනය කිරීමට උත්සාහ ගැනීමෙනුත්ය.

I වන පරිච්ඡෙදය :— බැංකුවේ අරමුණු, කාර්යයන් සහ සාමාජිකත්වය පිළිබඳ ව්‍යවස්ථා මෙහි දක්වා ඇත. (ගිවිසුමේ VII වන හා X වන පරිච්ඡෙද වල ද සාමාජිකත්වය පිළිබඳ සමහර විධිවිධාන අඩංගු වේ). පොදු වශයෙන් බැංකුවේ අරමුණ ලෙස සඳහන් කර ඇත්තේ, ආසියාවේ සහ ඈත පෙරදිග ප්‍රදේශයේ ආර්ථික වෘද්ධිය හා සහයෝගතාවය පෝෂණය කිරීමත් මෙම ප්‍රදේශයේ සංවර්ධනය වන සාමාජික රටවල ඒකීය වශයෙන් හා සමූහ වශයෙන් ආර්ථික සංවර්ධනයේ වේගය වැඩි කරලීම සඳහා කටයුතු කිරීමත් ය (1 වන වගන්තිය).

බැංකුවේ ඉතා වැදගත්ම කාර්යයන් වනුයේ, මෙම ප්‍රදේශයේ රාජ්‍ය හා පෞද්ගලික ප්‍රාග්ධනය සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීමට අනුබල දීම, ප්‍රදේශයේ සංවර්ධනය වන සාමාජික රටවල සංවර්ධනය සඳහා මුදල් යෙදවීමට බැංකුව වෙත ඇති සම්පත් උපයෝගි කර ගැනීම, එම රටවල සංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම් එකලස් කිරීම සහ ශිල්පීය සහාය සැලසීමත්ය (2 වන වගන්තිය).

එක්සත් ජාතීන්ගේ, ආසියාවේ සහ ඈත පෙරදිග ආර්ථික කටයුතු පිළිබඳ කොමිසමේ සාමාජිකයන්ට හා එහි ආශ්‍රිත සාමාජිකයන්ටත්, අනෙකුත් ප්‍රාදේශීය රටවලට හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන් වූ ප්‍රාදේශීය නොවන සංවර්ධන රටවලටත් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂිත ආයතන වලටත් මෙම බැංකුවේ සාමාජිකත්වය විවෘතව ඇත. (3 වන වගන්තිය).

II වන පරිච්ඡෙදයේ බැංකුවේ ප්‍රාග්ධන ව්‍යුහය දක්වා ඇත. එහි අනුමත ප්‍රාග්ධනය ඩොලර් සිය කොටියක් වේ. (100,00,00,000) (4 වන වගන්තිය). ප්‍රාදේශීය රටවල් හා ප්‍රාදේශීය නොවූ රටවල් විසින් එකතුව 100,00,00,000 වන ලෙස පිළිවෙලින් ඩොලර් කෝටි 65 ක් සහ 35 ක් බැගින් මෙම ප්‍රාග්ධනයට මූලික වශයෙන් දායක විය යුතුය. (අ. ඇමුණුම). ලංකාව විසින් ගෙවිය යුතු මූලික දායක මුදල ඩොලර් කෝටි 0·852 ලෙස නියම වී ඇත.

III වන පරිච්ඡෙදයෙන් දක්වෙනුයේ බැංකුවේ ක්‍රියාකාරිත්වය හා කටයුතු පිළිබඳ පිළිවෙත් හා මූලධර්මයන් ය. ගිවිසුමේ 1 වන හා 2 වන වගන්තිවල දක්වා ඇති අරමුණු හා කාර්යයන් ක්‍රියාවට නැගීමට පමණක් සම්පූර්ණ වශයෙන් ම බැංකුවේ සම්පත් සහ පහසුකම් යොදාගත යුතුවේ. (8 වන වගන්තිය)

බැංකුවේ වඩාත් වැදගත් වූ ක්‍රියාකාරී මූලධර්මයන් මෙසේ වේ :—

බැංකුවේ ක්‍රියාකාරී කටයුතු වලදී ප්‍රධාන වශයෙන්ම මුදල් යොදවනු ලබනුයේ නියමිත යෝජනා ක්‍රම සඳහාය. මුළු වශයෙන් ගත්කල මෙම ප්‍රදේශයේ එකමුතු ආර්ථික වෘද්ධියකට වඩාත් කාර්යක්ෂම ලෙස ආධාර වන යෝජනා ක්‍රම හා ක්‍රියා පිළිවෙළවල් වලට මෙහි දී ප්‍රමුඛත්ව ය ලැබෙනු ඇත. එසේම ප්‍රදේශයේ කුඩා හෝ මඳ වශයෙන් සංවර්ධනය වූ සාමාජික රටවල අවශ්‍යතාවන් ගැන විශේෂ සැළකිල්ලක් මෙහි ලා දක්වනු ලැබේ (14 වන වගන්තිය (I) සහ (II). බැංකුවේ ක්‍රියාකාරී කටයුතු වලදී විරාගත යහපත් බැංකු මූලධර්මයන් මගින් එය මෙහෙය වනු ලබනු ඇත. (14 වන වගන්තිය (XIV).

IV වන පරිච්ඡෙදයෙන් බැංකුවේ, ණය ලබා ගැනීමේ සහ වෙනත් විවිධ බලතල දක්වෙයි. (21 වන වගන්තිය).

V වන පරිච්ඡෙදයෙන් දක්වා ඇත්තේ ව්‍යවහාර මුදල් පිළිබඳ විධිවිධානයන් ය. එනම්, පරිවර්ත්‍යතාව තීරණය කිරීම (23 වන වගන්තිය), ව්‍යවහාර මුදල් වල ප්‍රයෝජනය (24 වන වගන්තිය) සහ බැංකුව වෙත ඇති ව්‍යවහාර මුදල් වල අගය ස්ථාවරව පවත්වා ගැනීම ( 25 වන වගන්තිය) යන කරුණුය.

VI වන පරිච්ඡෙදයෙන් බැංකුවේ කාර්ය මණ්ඩල හා පාලන සංවිධානය දක්වා ඇත.

**කාර්ය මණ්ඩල සංවිධානය :**

අධිපති මණ්ඩලයකින් ද, අධ්‍යක්ෂ මණ්ඩලයකින් ද, සභාපති වරයෙක්, උප සභාපති වරුන් එක් අයෙක් හෝ ඊට වැඩි ගණනක් සහ අවශ්‍ය යැයි හැඟෙන අනෙකුත් නිලධාරීන් හා කාර්ය මණ්ඩලයකින් ද බැංකුව සමන්විත වේ (26 වන වගන්තිය).

එක් එක් සාමාජික රටකින් එක් නියෝජිතයකු බැගින් වන සේ අධිපති මණ්ඩලය සැක සෙනු ඇත (27 වන වගන්තිය).

අධ්‍යක්ෂ මණ්ඩලය සැදෙනුයේ අධිපතීන් විසින් තෝරනු ලබන සාමාජිකයන් 10 දෙනෙකු ගෙනි. මෙයින් 7 දෙනෙකු ප්‍රාදේශීය වූ සාමාජිකයන් නියෝජනය කරන අතර අනෙක් 3 දෙනා නියෝජනය කරනුයේ ප්‍රාදේශීය නොවන සාමාජිකයන් ය (30 වන වගන්තිය).

බැංකුවේ සභාපති තෝරනු ලබනුයේ අධිපති මණ්ඩලය විසිනි (34 වන වගන්තිය).

සභාපතිගේ නිර්දේශය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් උප සභාපති වරයෙක් හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ඇත (35 වන වගන්තිය).

**බලතල හා කාර්යයන් :**

බැංකුවේ සියළුම බලතල පවරා ඇත්තේ අධිපති මණ්ඩලයටය (28 වන වගන්තිය).

බැංකුවේ පොදු ක්‍රියා කාරිත්වය පිළිබඳ වගකීම පැවරී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයටය. අනෙකුත් කාර්යයන්ට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් කළ යුතු කාර්යයක් නම් බැංකුවේ අය වැය ලේඛනය අනුමත කිරීමය (31 වන වගන්තිය).

අධ්‍යක්ෂ මණ්ඩලයේ මුලසුන දරනුයේ සභාපති විසිනි. ඔහුට හිමිවන්නේ තීරක ඡන්දය පමණි. බැංකුවේ නීත්‍යානුකූල නියෝජිතයා සහ බැංකු කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා ද වනුයේ සභාපතිය. බැංකුවේ එදිනෙදා කටයුතු කරගෙන යාම හා සංවිධානය කිරීම, සහ බැංකුවේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලයේ අය සංවිධානය කිරීම, පත් කිරීම හා සේවාවෙන් ඉවත් කිරීම පිළිබඳ වගකීම පැවරෙනුයේ ද සභාපතිටය. මෙහි ලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර පනවනු ලබන ව්‍යවස්ථා රීතීන් යටතේ සභාපති කටයුතු කළ යුතුවේ (34 වන වගන්තිය).

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන පරිදි බැංකුවේ පාලන කටයුතු වලදී උප සභාපති වරයෙකු විසින් ඒ ඒ බලතල දරමින් ඒ සම්බන්ධ කාර්යයන් ඉටු කරනු ඇත (35 වන වගන්තිය)

මෙම පරිච්ඡෙදයේ අනෙකුත් වගන්ති වලින් දක්වෙනුයේ බැංකුවේ අන්තර් ජාතික ස්වරූපය පිළිබඳ විධිවිධානයන් ය. බැංකුවට හෝ එහි නිලධාරීන්ට කිසිම දේශපාලන කටයුත්තක නිරත වීම තහනම්ය (36 වන වගන්තිය). බැංකුවේ ප්‍රධාන කාර්යාලය, පිලිපයිනයේ, මැනිලා නුවර පිහිටුවනු ඇත (37 වන වගන්තිය). බැංකුවේ කටයුතු වලදී භාවිතා වනුයේ ඉංග්‍රීසි භාෂාවය (39 වන වගන්තිය). බැංකුවේ ශුද්ධ ආදායම බෙදන අන්දම ඊලඟ වගන්ති යෙහි දක්වා ඇත (40 වන වගන්තිය).

**VII** වන පරිච්ඡෙදයේ දක්වා ඇති කරුණු මෙසේ ය. බැංකුවේ සාමාජිකත්වයෙන් පහ කිරීම හා තාවකාලිකව අත් හිටුවීම පිළිබඳව විධිවිධාන (41 වන හා 42 වන වගන්තිය මේ පිළිබඳ කරුණු ඉහතින් සඳහන් කළ පළමුවැනි පරිච්ඡෙදය යටතේ දක්වනු ලැබීය). ; බැංකුවේ ක්‍රියා කාරිත්වය තාවකාලිකව අත්හිටුවීම හා අවසන් කිරීම (පිළිවෙලින් 44 වන හා 45 වන වගන්තිය) සහ සාමාජිකයින් අතර වත්කම් බෙදන ආකාරය (47 වන වගන්තිය) යන කරුණු දක්වේ.

**VIII** වන පරිච්ඡෙදයෙන් බැංකුවේ සහ එහි නියුතු නිලධාරීන්ගේ තත්වයන් විශේෂ මුක්තීන්, මිදීම් හා වරප්‍රසාද පිළිබඳව ඇති විධිවිධාන දක්ව යි. බැංකුව අධිකරණ කටයුතු සම්බන්ධ ව සම්පූර්ණ වශයෙන් ම පෞද්ගලිකත්වය දරනු ඇත (49 වන වගන්තිය). යම් යම් සඳහන් කළ අවස්ථාවලදී හැර බැංකුව අධිකරණ ක්‍රියාකාරිත්වයෙන් නිදහස් වේ (50 වන වගන්තිය). එහි දේපල වත්කම්, ලේඛනාගාරය හා අනෙකුත් ලියකියවිලි සෝදිසි කිරීමෙන්, හා වෙනත් ක්‍රම මගින් අයත් කිරීමෙන් නිදහස් වනු ඇත (51 වන වගන්තිය හා 52 වන වගන්තිය). එහි ප්‍රවාහන හා පණිවුඩ හුවමාරු වලදී එයට විශේෂ වරප්‍රසාද ලැබේ (54 වන වගන්තිය). එහි අධිපතින්, අධ්‍යක්ෂ වරුන්, නිලධාරීන් හා සේවකයින් අවස්ථානුකූල කැඳවීම් වලදී සහ නීති තහනම් ආදියෙන් නිදහස්වේ. (55 වන වගන්තිය) බැංකුවේ වත්කම්, දේපල, ආදායම ආදිය සෑම බදු අය කිරීම් වලදී සහ රේගු තීරු බදු වලින් මිදෙන අතර එහි අධිපතිවරුන්ගේ, අධ්‍යක්ෂ වරුන්ගේ, නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ දේපල හා පඩි නඩි සඳහන් කර ඇති පරිදි යම් යම් බදු සහන ලැබෙනු ඇත (56 වන වගන්තිය). මේ ලෙසින් එය ලබා දී ඇති වරප්‍රසාද විශේෂ මුක්තීන් හා මිදීම් වලින් සමහරක් හෝ සම්පූර්ණ වශයෙන්ම අත් හැර දැමීමට බැංකුවට හැකිය (58 වන වගන්තිය).

**IX** වන පරිච්ඡෙදය යම් යම් විවිධ කරුණු සඳහා වෙන්ව ඇත. එනම් :— ගිවිසුමේ ඇති සංශෝධන (59 වන වගන්තිය), (ගිවිසුමේ විධිවිධාන වල අර්ථ නිරූපණය හෝ අදළ වීම (60 වන වගන්තිය), බේරුම් කිරීම, (61 වන වගන්තිය) සහ සාමාජිකයින්ගේ අනුමතියන් හා විරෝධත්වයන් (62 වන වගන්තිය) සඳහන් කරුණු මෙහි දක්වේ.

**X** වන පරිච්ඡෙදයෙන් ගිවිසුමේ අවසාන විධිවිධාන දක්වේ. ගිවිසුමට අදළ අත්සන් සහ තැන්පතු (63 වන වගන්තිය) ; අත්සන් තැබූවන් හා අනෙකුත් රටවල් විසින් ගිවිසුම ස්ථිර කිරීම හා පිළිගැනීම (64 වන වගන්තිය) ; ගිවිසුමේ ක්‍රියාත්මක වීම (65 වන වගන්තිය) සහ බැංකු කටයුතු ආරම්භ කිරීම (66 වන වගන්තිය) පිළිබඳ කරුණු මෙම පරිච්ඡෙදයෙන් පැහැදිලි කර ඇත.

ගිවිසුමේ ' අ ' ඇමුණුමේ දක්වා ඇති ලෙස මූලික දයක මුදල්වල එකතුව බැංකුවේ අනුමත ප්‍රාග්ධනයෙන් 65 % ට අඩුවන සේ දයක ප්‍රාදේශීය රටවල් දහයට නො අඩු ගණනක් ඇතිවන, අත්සන් තැබීමෙන් අඩුම වශයෙන් 15 ක් ගිවිසුම ස්ථිර කිරීම හෝ පිළිගැනීම පිළිබඳව සඳහන් නීත්‍යානුකූල ලේඛන තැන්පත් කළ විට ගිවිසුම ක්‍රියාත්මක වනු ඇත (65 වන වගන්තිය).

ගිවිසුමට ඇමුණුම් දෙකක් ඇත. අනුමත ප්‍රාග්ධනයට ප්‍රාදේශීය රටවල් (අ කොටස) ප්‍රාදේශීය නොවන රටවල් (ආ) විසින් කළ යුතු මූලික දයක මුදල් ප්‍රශ්නය (ආ) ඇමුණුමේ දක් වෙයි. (ආ) ඇමුණුමේ ප්‍රාදේශීය රටවල් නියෝජනය කරන අධිපතීන් විසින් (අ) සහ ප්‍රාදේශීය නොවන රටවල් නියෝජනය කරන අධිපතීන් විසින් (ආ) අධ්‍යක්ෂවරුන් තෝරා ගනු ලබන ආකාරය විස්තර වශයෙන් දක්වා ඇත.

## 1966 අංක : 22 දරන විසර්ජන පනත

**1966 - 67 මුදල් වර්ෂයේ සේවා සඳහා ද, එවැනි සේවා සඳහා ලංකාව තුළින් හෝ පිටතින් හෝ ණය ලබා ගැනීමට බලය පැවරීම සඳහා ද, එම මුදල් වර්ෂය තුළ රජයේ සමහර කටයුතු සම්බන්ධයෙන්, මුදල් වෙන් කිරීම සඳහාද, එම මුදල් වර්ෂය තුළ එවැනි කටයුතු සඳහා වියදම් කිරීම සඳහාද, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමටද, එම මුදල් ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවීමට ඉඩ සැලසීමට ද ඉහත කී කටයුතු වලට සම්බන්ධිතව හෝ ආනුෂංගිකව හෝ ඇති කරුණු සඳහා ඉඩ සැලසීමට ද, බලය පැවරෙන පනතකි.**

(සම්මත වූ දිනය : 1966 සැප්තැම්බර් 26)

1. මේ පනත, 1966 අංක 22 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) කුමන හෝ වියදමක් සඳහා බලය පැවරෙන වෙනත් අනෙක් නීතියකට හානියක් නොවන පරිද්දෙන්, 1966 ඔක්තෝබර් 1 වැනි දයින් පටන් ගෙන, 1967 සැප්තැම්බර් 30 වැනි දයින් අවසන් වන මුදල් වර්ෂයේ සේවාවන් සඳහා තක්සේරු කරන ලද රජයේ වියදම රුපියල් දෙසිය පණස් දෙකෝටි තිස්හය ලක්ෂ අනූපන්දහස් දෙසිය හැත්තෑ අටකි.

(අ) මෙයින් බලය පැවරෙන ගෙවීම්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ මුදල් වලින් ද, සහ

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් හෝ සඳහා හෝ ලංකාව තුළින් හෝ පිටතින් හෝ මුළු වශයෙන් රුපියල් කෝටි අනූ එකකට නොවැඩිව ලබා ගැනීමට මෙයින් බලය පැවරෙන ණය වලින් ද, ලබා ගත යුතුය.

මෙහි මින් පෙර සඳහන් රුපියල් දෙසිය පණස් දෙකෝටි තිස්හය ලක්ෂ අනූපන්දහස් දෙසිය හැත්තෑ අට මේ පනතෙහි පළමුවැනි උප ලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

(2) මේ වගන්තියේ (1) වැනි උප වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ දී, රජය සඳහා හෝ වෙනුවෙන් හෝ ණය ගැනීම සඳහා බලය පැවරෙන වෙනත් කුමන හෝ ලිඛිත නීතියක විධිවිධාන වලට හානියක් නොවිය යුතුය.

3. (1) මේ පනතේ දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමිත, ඒ ඒ කාර්යයන් සඳහා II වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ රජයේ ලැබීම්, ඒ ඒ කාර්යයන් සඳහා වෙන් වූ ගිණුමට බැර කළ යුතු ය. එහෙත්, එසේ බැර කරනු ලැබීම්, එම ලේඛනයෙහි III වැනි තීරුවෙහි, අනුරූප සටහනේ, නියමිත උපරිම සීමාව, නොඉක්මවිය යුතුය. එවැනි උපරිම සීමාව ඉක්මවා එවැනි කාර්යයන් ගෙන් ලැබෙන ලැබීම් ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මෙහි 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, මේ පනතෙහි, 2 වැනි උප ලේඛනයේ I වැනි තීරුවෙහි නියමිත, ඒ ඒ කාර්යය උඩ රජය විසින් කැරුන වියදම් එම මුදල් වර්ෂය තුළ එවැනි කාර්යයන් ගෙන් රජයට ලැබෙන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත් එවැනි වියදම් එම උප ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(3) 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ, මේ පනතේ දෙවැනි උප ලේඛන යේ 1 වැනි තීරුවෙහි නියමිත කුමන කාර්යයක් හෝ සම්බන්ධ ඉතිරිව ඇති හර ශේෂය, උප ලේඛනයේ IV වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය. එසේ ම එම මුදල් වර්ෂය අවසානයේ දී එකී කටයුතු සඳහා වූ මුළු වගකීම, එම උප ලේඛනයේ V වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය.

4. 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, ඕනෑම අවස්ථාවක මේ පනතේ දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි, නියමිත කුමන හෝ කාර්යයකින් රජයට ලැබෙන ලැබීම් එවැනි කාර්යයන් සඳහා රජයෙන් කැරෙන වියදම් පියවීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, එවැනි වියදම් පියවීමට මුදල් ඇමති විසින් අවශ්‍ය යැයි හඟින ප්‍රමාණයන් විටින් විට ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජයට සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අර මුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි මුදල් ඇමති විසින් නියෝගයකින් විධාන කළ හැකිය. එහෙත්, එසේ අත්තිකාරම් වශයෙන් දෙන මුළු ප්‍රමාණය එම උප ලේඛන යේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම වැය ප්‍රමාණය නො ඉක්මවිය යුතු ය. එවැනි කාර්යයක් සඳහා අත්තිකාරම් වශයෙන් දෙන යම් මුදලක්, මුදල් ඇමති විසින් නියෝගය කින් විධාන කරන පිළිවෙලට ඒකාබද්ධ අර මුදලට නැවත ගෙවිය යුතුය.

5. මේ පනතේ පළමුවැනි උප ලේඛනයේ විධිවිධානානුසාරයෙන්, අංක 3, 5 සහ 7 යන වැය ශීර්ෂ වලට හැර එම උප ලේඛනයේ නියමිත අනෙක් ශීර්ෂයක් යටතේ දක්වෙන වෙනත් වැය ශීර්ෂයකට, වෙන් කැරුන යම් මුදලක් වැය කොට නොමැති නම්, හා වැය කැරෙන ලෙසක් නොපෙනෙන්නේ නම්, භාණ්ඩාගාරයේ ලේකම් ගේ හෝ ඔහු විසින් බලය පවරා ඇති වෙනත් ඕනෑම නිලධාරියෙකු ගේ හෝ නියෝගය අනුව, එම ශීර්ෂය යටතේ වූ වෙනත් කුමන හෝ වැය ශීර්ෂයකට පැවරිය හැකිය.

6. මේ පනතෙහි දෙවැනි උප ලේඛනයේ II වැනි, III වැනි, IV වැනි හෝ V වැනි තීරුවල නියමිත උපරිම සීමාවන් රජයේ අනුමැතිය ඇතිව, 1968 ජූනි 30 වෙනි දට හෝ ඉන් පෙර මුදල් ඇමති විසින් නියෝග කිරීමෙන් වෙනස් කළ හැකිය. එවැනි කුමන හෝ නියෝගයක් එසේ ප්‍රකාශ කර ඇත්නම්, එහි නියම කළ හැකි එකී නියෝගය පැනවීමේ දිනට, පෙර දිනක සිට එකී නියෝගය ක්‍රියාත්මක වී ඇති බැව් සැලකිය යුතුය.

7. මේ පනතෙහි දෙවැනි උප ලේඛනයේ, උචිත තීරු වලට යම් කටයුත්තක් සහ එවැනි කටයුත්තකට සම්බන්ධ සියළුම හෝ කුමන හෝ උපරිම ප්‍රමාණයන් එකතු කොට, පාර්ලි මේන්තු යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකිය.

**උප ලේඛන පිළිබඳ සටහන**

මේ පනතේ පළමුවැනි උප ලේඛනයේ, 1966 ඔක්තෝබර් 1 වැනිදයින් පටන් ගෙන 1967 සැප්තැම්බර් 30 වැනි දයින් අවසන් වන මුදල් වර්ෂයේ පොදු සේවාවන් සඳහා ඒ ඒ වැය ශීර්ෂ යටතේ ගෙවිය හැකි ප්‍රමාණයන් කොටස් කොට දක්වා ඇත. මෙකී සේවා සඳහා ගෙවිය හැකි මුළු ප්‍රමාණය රුපියල් දෙසිය පණස් දෙකෝටි තිස් හය ලක්ෂ අනූ පන්දහස් දෙසිය හැත්තෑ අටක් (රු. 252,36,95,278·00) යයි ඇස්තමේන්තු කර ඇත. මේ පනතේ 2 (I) වැනි වගන්තිය යටතේ පවරා ඇති බලය යටතේ මෙම මුදල වැය කළ හැකිය.

දෙවැනි උප ලේඛනය, එම මුදල් වර්ෂය සඳහා රජයේ යම් යම් කටයුතු සම්බන්ධයෙන්, කැරුන මූල්‍ය ප්‍රතිපාදන බෙද දක්වීමකි. මෙකී බෙද දක්වීමෙහි, ඒ ඒ දෙපාර්තමේන්තු ශීර්ෂ යටතේ සහ එකී දෙපාර්තමේන්තු වල යම් යම් රජයේ කාර්යයන් සම්බන්ධයෙන්, රජයේ කටයුතු වල උපරිම වියදම් සීමාව, රජයේ කටයුතු ගිණුම්වලට බැර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, රජයේ කටයුතු වල හර ශේෂයන් සඳහා උපරිම සීමාව, සහ රජයේ කටයුතු වල වගකීම් සඳහා උපරිම සීමාව නියම කර ඇත. මෙකී මුදල් වියදම් කිරීම හා බැර කිරීම මේ පනතේ 3 වැනි වගන්තිය යටතේ පවරා ඇති බලය යටතේ, දී ඇති බෙද දක්වීම ප්‍රකාර සිදු කළ යුතු ය.

## 1966 අංක 28 දරන මුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

**1965 අංක 10 දරන මුදල් (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

(සම්මත කළ දිනය : 1966 ඔක්තෝබර් 14 වැනි දින)

1. මේ පනත 1966 අංක 28 දරන මුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හැඳින් විය හැකිය.

2. 1965 අංක 10 දරන මුදල් (විශේෂ විධිවිධාන) පනතින් අවලංගු කරනු ලැබූ එක් එක් ප්‍රඥප්තිය, එසේ එය අවලංගු කරනු ලැබුයේ වී නමුදු, ඒ ප්‍රඥප්තිය අවලංගු කරනු ලැබූ දිනයට පෙරාතුව වූ යම් කාල පරිච්ඡෙදයක් සම්බන්ධයෙන් එවැනි යම් ප්‍රඥප්තියක් යටතේ ගෙවිය යුතු වූ යම් බද්දක් එකතු කිරීමේ සහ අය කර ගැනීමේ කාර්යයන් සඳහා පමණක් වලංගු ව පැවති ලෙස, පවතින ලෙස, සහ තව දුරටත් වලංගු ව පැවැතිය යුතු ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව, මේ පනත ආරම්භ වීමේ දිනයට පෙර වුව ද, පසුව වුවද, එවැනි යම් ප්‍රඥප්තියක් යටතේ පූර්වෝක්ත කාර්යයන් සඳහා කරන ලද යම් ක්‍රියාවක් හෝ පවරන ලද යම් නීති කෘත්‍යයක්, ඒ ප්‍රඥප්තිය අවලංගු නො කර පැවතුනාක් මෙන්, —

(අ) ඒ ප්‍රඥප්තිය යටතේ අවසථාවෝචිත පරිදි නිසි ආකාරයට කරනු ලැබ ඇති ලෙස හෝ කරනු ලබන ලෙස, හෝ පවරනු ලැබ ඇති ලෙස හෝ පවරනු ලබන ලෙස සැලකිය යුතුය, තවද.

(ආ) කර ගෙන යා හැකිය, නොහොත් පවත්වා ගෙන යා හැකිය.

**චක්‍ර ලේඛ අංක : 23**

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. අංක : 590,
කොළඹ 1.
1966 අප්‍රේල් 6 වැනි දින.

**ප්‍රති මූල්‍යාධාර — මැදි කාලීන හා දිගු කාලීන ණය සඳහා වූ පොළී ප්‍රමාණ**

සම්බන්ධය : මුදල් නීති පනතේ 88. ඒ (1) (සී) වගන්තිය (1963 අංක : 11 දරන මුදල් පනතේ 67 වැනි වගන්තියේ විධිවිධාන පරිදිය).

ණය දෙන ආයතනවලට මහ බැංකුව විසින් දෙනු ලබන ප්‍රතිමූල්‍යාධාර ණය සඳහා වූ පොළී ප්‍රමාණ.

(අ) මහ බැංකුවෙන් ලබා ගන්නා ප්‍රතිමූල්‍යාධාර ණය වලින් තම අනුග්‍රාහකයින්ට දෙනු ලබන ණය වලට, ණය දෙන ආයතන විසින් වර්ෂයකට සියයට 6 කට නො වැඩි පොළියක් අය කරන්නේ නම්, කර්මාන්ත හා කෘෂිකර්මාන්ත නභාලීම සඳහා දෙනු ලබන ණය සඳහා පොළිය වර්ෂයකට සියයට 3 ක් විය යුතුය. එවැනි ආයතන විසින්, තේ සඳහා වූ යන්ත්‍රෝපකරණ මිල දී ගැනීමට ද අලුත් තේ කර්මාන්ත ශාලා ගොඩනැගීමට ද දෙනු ලබන ණය සඳහා, එවැනි ණයවල පොළී වලින් කොටසක් තේ පාලක විසින් ගෙවනු ලබන විට ද, ප්‍රතිමූල්‍යාධාර ණය වෙනුවෙන් අය කෙරෙන පොළී ප්‍රමාණය වර්ෂයකට සියයට 5 ක් විය යුතුය. මේ සඳහා මෙම පහසුකමින් ප්‍රයෝජන ගන්නා ණය දෙන ආයතන විසින් මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍යාධාර ඉල්වා ඇති ණය වලින් තම අනුග්‍රාහකයින්ට ණය දෙනු ලබන විට දී වර්ෂයකට සියයට 8 කට වැඩි පොළියක් අය නොකළ යුතුය.

(ආ) වෙළෙඳ, වාණිජ හෝ ව්‍යාපාරික කටයුතු නභාලීම සඳහා වර්ෂයකට සියයට 5 ක් විය යුතුය.

1964 අගෝස්තු 24 වැනි දින හා අංක : 19 දරන චක්‍ර ලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

**එස්. ඩී. අමරසිංහ,**
ප්‍රධාන ගණකාධිකාරී.
ශ්‍රී ලංකා මහ බැංකුව.

**ඩී. ඩබලිව්. රාජපතිරාන,**
අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

**චක්‍ර ලේඛඅංක : 1**

1966 ජූනි 8 වැනි දින
ප්‍රතිශෝධිතයි.

**මහ බැංකුවේ විනිමය අනුපාතික.**

(සම්බන්ධය : මුදල් නීති පනතේ 74 වැනි වගන්තිය)

1. මහ බැංකුව විසින් ලංකාවේ වෙළෙඳ බැංකු සමග කරනු ලබන ගනුදෙනු සඳහා පහත දැක්වෙන විනිමය අනුපාතික අදළ වේ.

| | විදුලි පුවත් මගින් කැරෙන පැවරීම් සඳහා මහ බැංකුවේ මිලට ගැනීම් අනුපාතිකයන් | විදුලි පුවත් මගින් කැරෙන පැවරීම් සඳහා මහ බැංකුවේ විකිණීම් අනුපාතිකයන් |
|---|---|---|
| රන් පවුම් (ලංකා රුපියලකට) | සි. පැ. | සි. පැ. |
| එතැන් | 1/6 3/64 | 1/6 1/32 |
| ඉදිරි (සමස තෙක්) | එතැන් සඳහා මසක වට්ටම පැ : 1/128* | එතැන් සඳහා මසක අධිමිල 1/128* |
| ඉදිරි (සමස තෙක්) බාරදීමට සම්බන්ධ ඉදිරි ඩොලර් මිලයට ගැනීම් වෙනුවෙන් | — | 1/6 1/32* |
| ඉන්දියානු රුපියල් (ඉන්දියානු රුපියල් සියයට) එතැන් | රු. 63 5/16 | රු. 63 3/8 |
| ඉදිරි (සමස තෙක්) | එතැන් සඳහා මසක වට්ටම රුපියලකින් 1/32* | එතැන් සඳහා මසක අධිමිල රුපියලකින් 1/32* |

* කොන්ත්‍රාත්තු ගැනීම වෙළෙඳ බැංකුවේ අභිමතය පරිදි විය යුතුය. එහෙත් කොන්ත්‍රාත්තු කාලය නිමවීමට පෙර නම්, එය ගතයුත්තේ කොන්ත්‍රාත්තු ගත් විනිමය අනුපාතිකය අනුවය.

2. වෙළෙඳ බැංකු සමග කැරෙන ගනුදෙනුවලට අදළ වන එ. ජ. ඩොලර් සඳහා වූ මහ බැංකු අනුපාතිකයන් නීත්‍යානුකූලව සමාන ප්‍රමාණයෙන් සියයට එකින් දෙකෙන් පංගුව ඇතුළත ප්‍රමාණයක වෙනසකට යටත් විය හැකිය. එවැනි වෙනස්කම් වන විටදී ඒ බව දැනුම් දෙනු ලැබේ.

3. මෙම චක්‍ර ලේඛයෙහි විධිවිධාන, ඕනෑම අවස්ථාවකදී ඉවත් කිරීම, ඒවාට එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම හෝ කළ හැකිය.

**එස්. ඩී. අමරසිංහ,**
**ප්‍රධාන ගණකාධිකාරී.**

**ඩී. ඩබ්ලිව් රාජපතිරාන,**
**අධිපති.**

# ශ්‍රී ලංකා මහ බැංකුව

චක්‍ර ලේඛ අංක : 2

1966 ජූනි 8 වැනි දින
ප්‍රතිශෝධිතයි.

**වෙළෙඳ බැංකු විනිමය අනුපාතික**
(සම්බන්ධය : මුදල් නීති පනතේ 76 වැනි වගන්තිය)

වෙළෙඳ බැංකු විසින් කරනු ලබන ගනුදෙනු සඳහා පහත දක්වෙන විනිමය අනුපාතික අදාළ වේ.

| | අවම මිලට ගැණුම් අනුපාතික විදුලි පුවත් මගින් ශුද්ධ පැවරීම් | | උපරිම විකුණුම් අනුපාතික විදුලි පුවත් මගින් ශුද්ධ පැවරීම් | |
|---|---|---|---|---|
| | රු. | සත | රු. | සත |
| රන් පවුම් — (ප. 1 ට) | 13 | 26 | 13 | 36 |
| (අ) රන්පවුම් 100 හෝ ඊට අඩු ප්‍රමාණයන් සඳහා | (රුපියලට 1/6 $\frac{3}{32}$ අනුරූපව) | | (රුපියලට 1/5 $\frac{31}{32}$ අනුරූපව) | |
| (ආ) රන්පවුම් 100 ට වැඩි ප්‍රමාණයන් සඳහා | 13 | 28 | 13 | 33 |
| | (රුපියලට 1/6 $\frac{1}{16}$ අනුරූපව) | | (රුපියලට 1/6 අනුරූපව) | |
| එක්සත් ජනපද ඩොලර් | මහ බැංකුවේ ගැණුම් අනුපාතිකයට වඩා අඩුවෙන් ඩොලර් 100 ට සත 75 කට නොවැඩි විය යුතුය. | | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට වඩා වැඩියෙන් ඩොලර් 100 ට රු : 1·50 ට නොවැඩි විය යුතුය. | |
| ඉන්දියානු රුපියල් (ඉන්දියානු රුපියල් 100 ට) | 63 $\frac{9}{32}$ | | 63 $\frac{13}{32}$ | |
| පකිස්තානු රුපියල් (පකිස්තානු රුපියල් 100 ට) | 99 $\frac{5}{8}$ | | 100 $\frac{5}{32}$ | |

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරි

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන.
අධිපති.